## පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. ii | 11. iv | 21. iii | 31. ii |
| 2. iv | 12. iv | 22. i | 32. iv |
| 3. iii | 13. i | 23. i | 33. i |
| 4. i | 14. iv | 24. i | 34. iv |
| 5. i | 15. ii | 25. i | 35. iii |
| 6. iv | 16. iv | 26. iii | 36. iv |
| 7. i | 17. i | 27. ii | 37. ii |
| 8. iv | 18. iii | 28. i | 38. i |
| 9. ii | 19. i | 29. i | 39. i |
| 10. iv | 20. iv | 30. iv | 40. iv |

## II වන පත්‍රය

01)

1. නි රි ග රි ස , ප ම´ ග රි ස
2. භෛරවි
3. 1925
4. [[ ]]
5. ඇම්. ඇස්. ප්‍රනාන්දු
6. මන්ද්‍ර, මධ්‍ය , උච්ච
7. පාරමිතා බල /කවාලා විළඳ ජාති / කවුරුදෝ අර කවුලුවෙන් / එන්න මදනලේ / කළිඳු ගංගා / මහ බෝධි මුලේ / සුපිපුණු සුගන්ධ
8. සොළොස්මත්
9. නාඩගම්
10. පැල් කවි
11. දාදරා තාලය
12. 3/3

02)

i. රාගයට අදාළ රාග සංගති ඇතුළත් වෙයි.
ස්වරවලින් පමණක් සර්ගම් නිර්මාණය වි ඇත.
ස්වර ඥානය මෙන්ම රාග ඥානය ද වර්ධනය වේ.
ස්වර මාළිකා නමින්ද හැඳින්වේ.

ii. යමන් රාගයේ මධ්‍යලය ගීතයේ තාලය - ත්‍රී තාල්

| | | | | |
|---|---|---|---|---|
| ස්ථායී | ග රි ස - | නි රි ස - | ප ම´ ග රි | ග - - - |
| | **දි නි දා s** | **අ ව රේ s** | **බැ ස ය න්** | **නේ s s s** |
| | නි රි ග ම | ප ම´ ග ප | රි රි ග රි | ස - - - |
| | **ම ඳ අ ඳු** | **රේ s ලො ව** | **නැ හැ වෙ න්** | **නේ s s s** |
| | 0 | 3 | × | 2 |
| අන්තරා | ග ග ප ධ | ස් - ස් - | නි ධ නි රි | ස - - - |
| | **පෙ ළ ගැ සෙ** | **මි න් ව වු** | **ලෝ s ඇ දෙ** | **ති s s s** |
| | නි රි ග රි | ස් නි ධ ප | ම´ ප නි ධ | ප - - - |
| | **බි ළි දෝ s** | **ම වි තු රු** | **ලේ s නි ද** | **තී s s s** |
| | ග රි ග රි | නි රි ස - | නි ධ නි ධ | ම´ ධ ප - |
| | **සී s ත ල** | **සු ළ ඟි න්** | **ග ත සි ත** | **නැ ළ වෙ යි** |
| | ග - ග රි | ග ම´ ප ධ | ස රි ග රි | ස - - - |
| | **ශෝ s භ න** | **මේ s සැ න්** | **දෑ s යා s** | **මේ s s s** |

**iii.** ජාතිය - සම්පූර්ණ
මුඛ්‍යාංගය - මගු , සරිස , ධ නි ස
වාදි - මධ්‍යමය
සංවාදි - ෂඩ්ජය

03)

i. මෙහෙ ගී
ඇදහිළි හා විශ්වාස මත ගොඩනැගුනු ගී
මෙහෙ ගී
කෙළි ගී
මෙහෙ ගී
කෙළි ගී

ii. ආඝාතය හෙවත් තිත ( තාලය ) තබමින් ගායනා කළ හැකි පරිදි ආඝාතාත්මක ජන ගී ලෙස හැඳින්වේ. මෙහි ලක්ෂණයක් ලෙස නියමිත මාත්‍රා ගණන් අනුව පද බෙදා දක්වමින් ප්‍රස්තාර කිරීම හැඳින්විය හැක.
උදා:- ඉ ප ල් | පි ටි න් | ග හ න | අ ව් ව

අාඝාතය හෙවත් තිත ( තාලය) තබමින් ගායනය කළ නොහැකි පැදි අනාඝාතාත්මක ජන ගී ලෙස හැඳින්වේ. මෙහි දී ගායකයාගේ අභිමතය පරිදි යති පිහිටුවාගෙන ඇද පැද ලෙලවා ගායනය කිරීමේ නිදහසක් ඇත. සමූහ ගායනයට සුදුසු නොවේ.
උදා :- ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන්

iii. තුන්සරණේ ගී / ශාන්ති කර්ම ගී

04)

i. නූර්ති , නාඩගම්
ii. නූර්ති - උත්තර භාරතීය සංගීතය
නාඩගම් - දක්ෂිණ භාරතීය සංගීතය
iii. නූර්ති - දුටුගැමුණු , සිරිසඟබෝ , ශ්‍රී වික්‍රම , පද්මාවතී.
නාඩගම් - කාලගොල , බැලසන්ත , බ්‍රම්බෝඩි , ඉයුජින්.

05)

- ✳ කපිරිඤ්ඤා සංගීතය
- ✳ කපිරිඤ්ඤා සංගීතය පෘතුගීසීන් සහ කාපිරි ජනයා අතර ප්‍රචලිත වූ සංගීත සම්ප්‍රදායකි.
- ✳ ප්‍රථමයෙන් පුත්තලම ,මඩකලපුව යන ප්‍රදේශවල සහ මුහුදු බඩ ප්‍රදේශවල සහ මුහුදුබඩ ප්‍රදේශවල ව්‍යාප්ත වූ පසුව නාගරික ජනයා අතර ද ව්‍යාප්ත විය.
- ✳ කපිරිඤ්ඤා ගී තනු සරල බවෙන් , වේග රිද්මයෙන් ( 6/8 රිද්මය ) හා බෙම්ටෝ තාලය අනුව නිර්මාණය වී තිබීම එහි සුලභ ලක්ෂණයක් විය.
- ✳ වේග රිද්ම ගායන වාදන අංගවලින් සමන්විත වී හා ස්පාඤ්ඤ භාෂාව යොදා ගැනීම මෙම ගීතවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි.
- ✳ වයලිනය , වියෝලා , මැන්ඩලීනය , බැන්ගෝ, ගිටාරය වැනි සංගිත භාණ්ඩ භාවිතා කිරීම.
- ✳ උත්සව අවස්ථාවලදි කපිරිඤ්ඤා සංගීතයට අනුව ගැයෙන ගීතවලට සමගාමීව බයිලා සහ නැටුම් අංගයන්ගෙන් යුක්ත වීම.
- ✳ කපිරිඤ්ඤා සංගීතයට සම්ප්‍රදායට අනුගතව නිර්මාණය වූ බයිලා ගීත ගණනාවක් සංගීත රසිකයන් අතර ව්‍යාප්ත වූ අතර අයරින් ජොසපින් රොසලීන්,රස ආහාර කවලා , මී වදයකි ජීවිතේ , වැනි ගීත වඩාත් ප්‍රචලිත විය.
- ✳ තවද කපිරිඤ්ඤා සංගීතය ඇසුරු කරමින් නිර්මාණය වූ ගීත අතර වොලී බැස්ටියන් , ඇම්. ඇස් ප්‍රනාන්දු , ඇන්ටන් ජොන්ද් වැනි ගායන ශිල්පීන් හැඳින්විය හැක.

**සේ ගී**

- භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ හසල දැනුමක් සහිත උගතුන් පඬිවරුන් විසින් නිර්මාණය වී ඇති ගී විශේෂය සේ ගී වශයෙන් හඳුන්වනු ලැබේ .
- උපමා උපමේය , එළිසමය , එළිවැට , ශබ්ද අලංකාරය මෙම සේ ගී වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ වේ.
- මෙම භාෂා අලංකාර හා උපක්‍රම තුළින් ගැමි ගී හා සේ ගී වෙන්කර හඳුනා ගත හැකිය.
- විවිධ විරිත් මත මෙම සේ ගී නිර්මාණය වී ඇත. උදා:- දොළොස්මත් , සොළොස්මස් , සුවිසිමත් ආදි විරිත් සඳහන් කල හැකිය.
- මෙම ගී රචනා කරනු ලැබුවේ උගතුන් හා වියත් පඬිවරුන් වන අතර ඔවුන්ගේ උගත් බව සමාජයට හැඟවීමට මේවා රචනා කල බවද ජන ප්‍රවාදයේ සඳහන්වේ.
- සේ ගී සාමාන්‍ය ජනතාව තේරුම් ගැනීමට හා රසවිදීමට අවස්ථාවක් නොලැබුණු අතර භාෂාව සාහිත්‍ය උගත් ජනතාව විසින්ම මෙම ගී ව්‍යවහාර කළ බව ද සඳහන් වේ.
  උදා :- ප්‍රශස්ති , වන්නම් , හටන් ගී , වැලපුම් ගී , සන්දේශ කාව්‍ය හඳුන්වා දිය හැකිය.

සී. ද එස්. කුලතිළක

- 1970 දී ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සංගීත පර්යේෂණ අංශ ප්‍රධාන තනතුරට පත් විය.
- ලංකා කලා මණ්ඩලයේ සමාජිකයෙකු හා සභාපතිවරයෙකු ලෙසද සංගීත අනුමණ්ඩලයේ සභාපතිවරයා ලෙසද ජන ගායනා අනුමණ්ඩලයේ සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇත.
- ලංකාව පුරා පැවති ජන ගී එක්රැස් කරමින් සංරක්ෂණය කිරීමට කටයුතු කළේය.
- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය , විශ්ව සංගීත ක්ෂේත්‍ර , සංගීත සිද්ධාන්ත නම් ග්‍රන්ථ කිහිපයක් රචනා කරන ලදී.
- "බැද්ද වටේ සුදු මොරමල් පිපිලා , දැතට වළලු මල් මුතුවැල් මාල පොටයි" යන ගීත මෙතුමා විසින් ජන ගී ආශ්‍රය කරමින් නිර්මාණය කළ ජනප්‍රිය සරල ගීතයි.
- 1979 දී සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත.

ඩබ්.බී මකුලොළුව මහතා

- ජන සංගීතය විෂය ලංකාවේ පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කලේ මෙතුමාය.
- "දෙපානෝ" ,"පහනින් පහන" වැනි නාට්‍ය නිර්මාණය කර ඇත.
- හෙළ ගී මග , සිහිති ගීත , අභිනව මූලික ගීත යනුවෙන් ග්‍රන්ථ කිහිපයක් රචනා කර ඇත.
- අරුණට පෙර චිත්‍රපටය සඳහා සංගීතය සපයා ඇත.
- ගොයම් දා මඟුල , මාර පරාජය , හිර ගෙයින් මරු මුවට , මහාභිනිශ්ක්‍රමණය ආදි ප්‍රථම සංධ්වනි හතරක් නිර්මාණය කිරීම.

06)

A. දීප්චන්දි
B.කෙහෙර්වා
C.ජප් තාලය
D.ත්‍රි තාල්

II) දීප්චන්දි

| | | | | |
|---|---|---|---|---|
| මාත්‍රා | 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
| බෝල්ව | ධා ධිං ऽ | ධා ධා ධිං ऽ | තා තිං ऽ | ධා ධා ධිං ऽ |
| තාල සංඥා | × | 2 | 0 | 3 |

කෙහෙර්වා

| | | |
|---|---|---|
| මාත්‍රා | 1 2 3 4 | 5 6 7 8 |
| බෝල්ව | ධ ගෙ න ති | න ක ධි න |
| තාල සංඥා | × | 0 |